# සුරැකුම්පත් වෙළෙඳපොළ හා නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමය

කේ.ඩී.එච්.යූ. ගුණසේකර, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
helanigunasekara@hotmail.com

කේ.ඩී.ඒ.කේ. ප්‍රනාන්දු, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
akithmini41@gmail.com

එම්.ඒ.ඩී.එන්. සඳමාලි, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
sandamalimuthugoda1@gmail.com

පී.ඒ.ටී. පද්මසිකා, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
thilinipatp@gmail.com

**සංක්ෂේපය**

රටෙහි ආර්ථික වර්ධනය හා ස්ථායීතාව උදෙසා මූල්‍ය වෙළෙඳපොළක ක්‍රියාකාරීත්වය යහපත්ව පවත්වා ගැනීම අවශ්‍ය වේ. එම මූල්‍ය වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන උප වෙළෙඳපොළක් වන්නේ සුරැකුම්පත් වෙළෙඳපොළ යි. එහි දී මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමත්, ශ්‍රී ලංකාවේ 1987 අංක 37 දරණ සුරැකුම්පත් සභා පනත, සුරැකුම්පත් වෙළෙඳපොළ ආරම්භ කිරීමේදී ත්, කාර්යක්‍ෂම කිරීමේදී ත් දක්වනු ලැබූ දායකත්වය පිළිබඳවත්, සුරැකුම්පත් වෙළෙඳපොළ පිළිබඳවත්, සුරැකුම්පත් වෙළෙඳපොළ නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක් දක්වා විකාශය වී ඇති ආකාරයත්, එහි දී නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයකින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳවත්, විග්‍රහයක් මෙහි අන්තර්ගත වේ. මේ සඳහා පොත් පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු වැනි ද්විතියික දත්ත මූලාශ්‍ර භාවිතා කර ඇත.

**මුඛ්‍ය පදඃ** සුරැකුම්පත් වෙළෙඳපොළ, නිර්ලේඛන සුරැකුම්පත් වෙළෙඳපොළ

## හැඳින්වීම

රටක ආර්ථික සංවර්ධනය උදෙසා මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය වීම අත්‍යවශ්‍ය සාධකයකි. දියුණු මූල්‍ය වෙළෙඳපොළ හා ආර්ථික සංවර්ධනය අතර අනුලෝම සම්බන්ධතාවක් තිබේ. රොබට් ලූක්ස් (**1988**), ජෝන් රොබට්සන් වැනි ආර්ථික විද්‍යාඥයින් රටක ආර්ථික වර්ධනය උදෙසා මූල්‍ය වෙළෙඳපොළ දියුණු වීම වැදගත් බව ප්‍රකාශ කරන ලදී. මෙම මූල්‍ය වෙළෙඳපොළ දියුණුවීම, ඒ තුළ ක්‍රියාත්මක වන උප වෙළෙඳපොළ, මූල්‍ය උපකරණ සංවර්ධනය වීම තුළින් ඇති වේ. ඒ අනුව මූල්‍ය වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන සුරැකුම්පත් වෙළෙඳපොළ ලේඛිත ක්‍රමයේ සිට නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක් දක්වා දියුණු වීම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් සඳහා අවශ්‍යයෙන් ම වැදගත් වේ.

## මූල්‍ය වෙළෙඳපොළ හැඳින්වීම

මූල්‍ය වෙළෙඳපොළ යනු ලාභ හෝ ආදායම් ඉපයීමේ අරමුණින් අරමුදල් ගනුදෙනු කිරීම සඳහා වන මූල්‍ය උපකරණ නිකුත් කිරීම හා වෙළෙඳාම් කිරීම සඳහා ඇති

සංවිධානයක් ය. මූල්‍ය වෙළෙඳපොළවල වෙළෙඳාම් කරන්නේ ඉතුරුම් අරමුදල් ය. දියුණු මූල්‍ය වෙළෙඳපොළවල් ඇති රටවල මුදලේ කාර්යක්‍ෂමතාව ඉහළ මට්ටමක පවතී. වෙනත් වෙළෙඳපොළවල මෙන් ම මූල්‍ය වෙළෙඳපොළක ද ක්‍රියාකාරීත්වය මූලික අංග කිහිපයක් යටතේ සාකච්ඡා කළ හැකි ය. එනම් වෙළෙඳ අයිතමය, එහි ඉල්ලුම, සැපයුම හා මිල ගණන් ය. වෙළෙඳ අයිතමය වන්නේ අරමුදල් වෙළෙඳාම සඳහා ගෙනුදෙනු කරන මූල්‍ය ආයෝජන උපකරණ යි. ඉල්ලුම යනු අරමුදල් සැපයීම තුළින් එම ආයෝජන උපකරණ මිල දී ගැනීම යි. මූල්‍ය වෙළෙඳපොළක ඉල්ලුම්කරුවන් වන්නේ අරමුදල් සැපයුම්කරුවන් හෝ ඉතුරුම් අරමුදල් හිමියන් ය. සැපයුම යනු අරමුදල් සපයා ගැනීම සඳහා මූල්‍ය ආයෝජන උපකරණ විකිණීම යි. මිල යනු එම උපකරණවල මිල යි.

මෙලෙස ණය අරමුදල් හා ප්‍රාග්ධනය අලෙවි කිරීමට හා මිල දී ගැනීමට සංවිධානය වී ඇති මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරී ස්වරූපය අනුව කොටස් දෙකකි. එනම් සංවිධිත මූල්‍ය වෙළෙඳපොළ හා අසංවිධිත මූල්‍ය වෙළෙඳපොළ යි. සංවිධිත මූල්‍ය වෙළෙඳපොළ යම් යම් නෛතික පදනම් මත පිළිගත් ලිඛිත ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක වේ. අසංවිධිත මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ ලිඛිත නොවන ගනුදෙනුකරුවන් වාචිකව එකඟවන මෙහෙයුම් උපදෙස් අනුව යි.

මූල්‍ය වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන උප වෙළෙඳපොළවල් කිහිපයක් වේ. එනම්,

- අන්තර් බැංකු ඒක්‍ෂණ ණය මුදල් වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
- වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
- අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
- සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ
- කොටස් වෙළෙඳපොළ

**1987 අංක 37 දරණ සුරැකුම්පත් සභා පනත**

1987 අගෝස්තු මස 20 වන දින නීතිගත කරන ලද 1987 අංක 37 දරණ සුරැකුම්පත් සභා පනත මඟින් ලියාපදිංචි සමාගම්වල සුරැකුම්පත් වෙළෙඳාම ක්‍රමවත් කිරීම සහ රටේ මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳ විශ්වාසය වඩා තහවුරු කිරීම යන කරුණු ද හඳුන්වා දෙන ලදී. රජයේ පරමාර්ථය වී ඇත්තේ පෞද්ගලික අංශයේ ආයෝජකයින් තවදුරටත් ආයෝජන කටයුතු සඳහා පෙළඹවීමට අවශ්‍ය  වන්නා වූ ආයෝජන අවස්ථා සලසා දීමත්, ඔවුන්ට අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීමත් ය. ප්‍රාග්ධන ආගලනයේ ඌණතා පවතින අවස්ථාවල සාමාන්‍ය ඉතිරි කිරීම්වල සැලකිය යුතු ඉහළ යාමක් අවශ්‍ය වේ. මෙම පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ද ඉතිරි කිරීම් ධෛර්යමත් කළ යුතු අතර, මුදල් ප්‍රතිපත්ති සහ ආයතනික පහසුකම් පෞද්ගලික අංශය ධෛර්යමත් කිරීමට හේතු වේ. මේ අනුව සුරැකුම්පත් සභා පනත පිහිටුවීම ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හා මූල්‍ය සංවර්ධනය සඳහා ඉතා වැදගත් වන්නකි. පෞද්ගලික ඉතිරි කිරීම් වැඩි කිරීම හා ඒවා ආයෝජන කටයුතු සඳහා යොමු කිරීමෙන්

ශ්‍රී ලංකාව වැනි රටක කාර්යශීලී ප්‍රාග්ධන වෙළෙඳපොළකට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි අතර, එය ආදායම් හා රැකියා අවස්ථා ඇති කිරීමට හේතු වේ.

අනෙක් රටවලට වඩා ශ්‍රී ලංකාවේ සමාගම්වල ණය අනුපාතය ඉතා ඉහළ මට්ටමක පවතී. විශේෂයෙන් සංවර්ධන ආර්ථිකයන්හි ප්‍රාග්ධන වෙළෙඳපොළ, ආයෝජන සඳහා අවශ්‍ය ඉතිරි කිරීම් වැඩි කිරීමට විශාල මෙහෙයක් ඉටු කර ඇත. නව සුරැකුම්පත් සහා පනත මඟින් ලියාපදිංචි සමාගම්වල සුරැකුම්පත් වෙළෙඳාම පහත සඳහන් පරිදි තහවුරු කිරීමට පියවර ගෙන ඇත.

- සතුටුදායක ලෙස ගනුදෙනු කළ හැකි සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇතිකිරීම.
- සතුටුදායක වෘත්තීය මාර්ග තත්ත්වයක්, මූලධර්ම හා මාර්ගෝපදේශ තත්ත්වයක් ලබා දීම සඳහා ද සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රමානුකූල ලෙස ස්ථාපිත කිරීම.
- වන්දි අරමුදලක් පවත්වා ගෙන යාමෙන් ආයෝජකයින්ගේ ආයෝජන සහ පොලී ආරක්ෂා කිරීම.

**සුරැකුම්පත් වෙළෙඳපොළ**

මූල්‍ය වෙළෙඳපොළක සංවිධිත අංශය නියෝජනය කරනු ලබන්නේ සුරැකුම්පත් වෙළෙඳපොළ යි. හේතුව නම් මූල්‍ය වෙළෙඳපොළක සංවිධිත මූල්‍ය වෙළෙඳපොළවල ගනුදෙනු කරන මූල්‍ය උපකරණ සුරැකුම්පත් වීම යි. සුරැකුම්පත් සරල ලෙස නිර්වචනය කිරීමේ දී, යම් මූල්‍ය ආයෝජනයක තොරතුරු ඇතුළත් නීතිමය ඔප්පුවක් හෝ ලේඛනයක් සුරැකුම්පතක් වේ. (සමරසිරි, 2014). සුරැකුම්පත් වෙළෙඳපොළ, ඒ අනුව සුරැකුම්පත් විකිණීම හා මිල දී ගැනීම යන අන්‍යොන්‍ය ක්‍රියාකාරකම් එකිනෙකට සම්බන්ධ කරන්නා වූ යාන්ත්‍රණයකි. සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ කොටස්, බැඳුම්කර, වාණිජ පත්‍ර, රුපියල් සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් යන මූල්‍ය උපකරණ බහුල වශයෙන් හුවමාරු වේ. ඉන් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රධාන වේ. සුරැකුම්පත් වෙළෙඳපොළක්, ඒ තුළ සිටින සෑම ගනුදෙනුකරුවෙක් ම සම්බන්ධ කරනු ලබන්නේ කාර්යක්ෂම කොන්දේසි කිහිපයක් මත පදනම් වෙමිනි. එනම්,

- නව සුරැකුම්පත් නිකුත් කිරීමේ අභිලාශයෙන් නව ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම.
- මූර්ත වත්කම්, මූල්‍ය වත්කම්වලට පරිවර්තනය කිරීම.
- ලාභදායීත්වයක් ව්‍යුත්පන්න කිරීමේ අරමුණින් කෙටිකාලීනව හා දිගුකාලීනව මුදල් ආයෝජනය.
- වාණිජ ක්‍රියාකාරීත්වය, එනම් සුරැකුම්පත් වෙළෙඳපොළේ ලාභයක් ඉපයිය හැකි ලෙස ක්‍රියා කිරීම.
- මිල තීරණය, එනම් ඉල්ලුම හා සැපයුම සමතුලිත වීමේ යාන්ත්‍රණය, එහි දී ඉල්ලුම් හා සැපයුම් බලවේග සඳහා නිදහස් හැසිරීමක් ලබා දී සුරැකුම්පත්වල නිවැරදි මිල තීරකයන්ට ඉඩ හැරීම.
- තොරතුරු දක්වන යාන්ත්‍රණයේ නිවැරදි ක්‍රියාකිරීම. එනම් සුරැකුම්පත් වෙළෙඳපොළේ සිටින සියලු ගනුදෙනුකරුවන්ට සමානව තොරතුරු බෙදාහැරීමේ යාන්ත්‍රණය.

- නියාමන ක්‍රියාකාරීත්වය., එනම් වෙළෙඳපොළ නියමයන්, ප්‍රතිපත්ති නියාමනය, ප්‍රමුඛතා තීරණය ආදිය.
- අයිතිය පැවරීම. එහි දී කොටස් හෝ වෙනත් මූල්‍ය උපකරණයක ආයෝජනය කළ ආයෝජකයන් තවදුරටත් තම ආයෝජන නඩත්තු කිරීමට අභිප්‍රායක් නොමැති අවස්ථාවේ දී, එම ආයෝජන දියුණු කළ හැකි වෙනත් පුද්ගලයින්ට පැවරීම.

මෙම ඉහතින් දැක් වූ කොන්දේසි සියල්ලක් ම සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ කටයුතු කරන වෘත්තීය හෝ වෘත්තීය නොවන සියලු ගනුදෙනුකරුවන්ට අදාළ වේ.

සුරැකුම්පත් වෙළෙඳපොළ ප්‍රධාන වශයෙන් ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතියික වෙළෙඳපොළ ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.

ප්‍රාථමික වෙළෙඳපොළ යනු ප්‍රාග්ධන වෙළෙඳපොළේ එක් කොටසකි. මෙම ප්‍රාථමික වෙළෙඳපොළ මඟින් නව සුරැකුම්පත් නිකුත් කරනු ලබන අතර, ආයතන, රජය හෝ රාජ්‍ය අංශයට මෙම නව කොටස් හෝ බැඳුම්කර විකුණා අරමුදල් ලබාගත හැකි ය. මෙය බොහෝ විට සිදුකරනුයේ සුරැකුම්පත් වෙළෙඳුන් මඟිනි. මෙම නව සුරැකුම්පත්, ආයෝජකයින් වෙත නිකුත් කිරීම “සුරැකුම්පත් ප්‍රාරක්ෂණය” ලෙස හැඳින්වේ. මෙම සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙළෙඳපොළ නව සුරැකුම්පත් නිකුත් කිරීමේ වෙළෙඳපොළ ලෙස හඳුන්වන අතර, ප්‍රාථමික වෙළෙඳපොළ ආර්ථිකයේ ප්‍රාග්ධන සැකැස්ම පහසු කිරීම සඳහා ඉතා වැදගත් දායකත්වයක් දක්වයි.

ද්විතියික වෙළෙඳපොළ පිළිබඳ සලකා බැලීමේ දී, එය “පසු වෙළෙඳපොළ” ලෙස ද හඳුන්වනු ලැබේ. පළමු වර ප්‍රාථමික වෙළෙඳපොළෙන් මෙම සුරැකුම්පත් නිකුත් කරනු ලබන විට එම සුරැකුම්පත් මිල දී ගත හැකි වන්නේ පෞද්ගලික ආයතන හෝ රජයෙනි. මෙලෙස මූලික නිකුත් කිරීමට පසුව ආයෝජකයින්ට නැවත වෙනත් ප්‍රාථමික වෙළෙඳපොළකින් සුරැකුම්පත් මිල දී ගත් ආයෝජකයෙකුගෙන් මෙම සුරැකුම්පත් මිල දී ගත හැකි ය.

එමෙන් ම සුරැකුම්පත් වෙළෙඳපොළක් තුළ සුරැකුම්පත් ගනුදෙනු වන ආකාරය අනුව ද වර්ගීකරණය කළ හැකි ය. ඇතැම් සුරැකුම්පත් සාමාන්‍යයෙන් භාවිත වන කඩදාසි ලේඛන ලෙස ආයෝජකයාට ලැබෙන අතර, ඇතැම් සුරැකුම්පත් නිර්ලේඛන වන අතර, ඒවා පරිගණක ගත සුරැකුම්පත් ගිණුම්වල සටහන් ව පවතී. සමහර සුරැකුම්පත් නැවත නැවත ගනුදෙනු කළ හැකි අතර, නව ගැණුම්කරුවන්ට ඒවායෙහි අයිතිය හිමි වේ. මෙවැනි සුරැකුම්පත් ගනුදෙනු කළහැකි උපකරණ (Negotiable Instrument) ලෙස හැඳින් වේ. මෙම සමහර සුරැකුම්පත් විකිණීමේ දී විකුණුම්කරු විසින් ඒවා පිටසන්කර ගැණුම්කරුට භාරදිය යුතු ය. සමහර සුරැකුම්පත් පිටසන් කිරීමෙන් තොරව භාරදීමෙන් පමණක් අයිතිය පැවරේ. මෙවැනි සුරැකුම්පත් “භාරක බැඳුම්කර” නම් වේ.

එලෙස ම සුරැකුම්පතේ ස්වභාවය පදනම් කරගනිමින් වෙළෙඳපොළ වර්ගීකරණය වන අවස්ථා ද දක්නට ලැබේ. එම වර්ගීකරණයන් වන්නේ,

- මුදල් වෙළෙඳපොළ (වර්ෂයකට වඩා අඩු පරිණත කාලයක් ඇති භාණ්ඩාගාර බිල්පත් වැනි සුරැකුම්පත් ගනුදෙනු සිදුවන වෙළෙඳපොළ)

- ප්‍රාග්ධන වෙළෙඳපොළ (දිගුකාලීන අරමුදල් සම්බන්ධ සුරැකුම්පත් වෙළෙඳ ගනුදෙනු කරන වෙළෙඳපොළ)
- මූල්‍ය ව්‍යුත්පන්න වෙළෙඳපොළ (සුරැකුම්පත්වල අනාගත මිල හෝ වෙළෙඳපොළ වටිනාකම් පිළිබඳ මූල්‍ය ගිවිසුම් හෙවත් මූල්‍ය ව්‍යුත්පන්න කරන වෙළෙඳපොළ)

මෙලෙස වර්ගීකරණය කර දැක්වීමෙන් පසුව ණය වෙළෙඳපොළ යටතේ, රාජ්‍ය සුරැකුම්පත් හා පෞද්ගලික සුරැකුම්පත් ලෙස ප්‍රභේද දෙකක් පවතින අතර, එම ප්‍රභේද දෙක තීරණය වී ඇත්තේ සුරැකුම්පත් නිකුත් කිරීමේ පදනම මත යි.

රජයන් විසින් වෙළෙඳපොළෙන් ණය ලබාගැනීම සඳහා රාජ්‍ය සුරැකුම්පත් නිකුත්කරනු ලැබේ. රටක ඉතා අඩු අවදානමක් සහිත සුරැකුම්පත් රාජ්‍ය සුරැකුම්පත් ලෙස සැලකේ. ඊට හේතුව රජයන් ණය පැහැර නොහරින බවට ඇති විශ්වාසය යි. රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රධාන වර්ග දෙක ලෙස භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සැලකේ.

පෞද්ගලික ණය සුරැකුම්පත් ලෙස හැඳින්වෙන්නේ, සමාගම් හා බැංකු මැදිකාලීනව ණය වෙළෙඳපොළෙන් අරමුදල් ලබාගැනීම පිණිස නිකුත් කරනු ලබන්නකි.

**නිර්ලේඛන සුරැකුම්පත්** (Scripless Securities)

නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමය පිළිබඳ විග්‍රහ කිරීමේ දී එය සිදුවන "ලංකා සෙකියු" (Lanka Secure) ලෙස හැඳින්වන්නේ, සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමත්, ඒවාට අදාළ තොරතුරු විද්‍යාත්මක ක්‍රමයක් මාර්ගයෙන් ගබඩාකර තැබීමටත් හැකි වන ක්‍රමයකි. නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක අරමුණ වන්නේ ලේඛන සහිත සුරැකුම්පත් ක්‍රමය ඉවත් කොට විද්‍යුත් මාධ්‍ය පදනම් කොටගෙන නිර්ලේඛන සුරැකුම්පත් වෙළෙඳාම පියවීම සඳහා ක්‍රමයක් හඳුන්වා දීමයි. නිර්ලේඛන සුරැකුම්පත්වලට අදාළ වෙළෙඳ තොරතුරු වාර්තා කර ගැනීම සඳහා වන මධ්‍යම තැම්පතු ක්‍රමය (Central Depository System-CDS) ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇත. මෙම "ලංකා සෙකියු" පද්ධතිය තුළ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය (Scripless Securities Settlement System - SSSS) නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු ක්‍රමය (Scripless Securities Depository System - SSDS) ලෙස ක්‍රම දෙකක් මඟින් රජයේ සුරැකුම්පත් සහ මහ බැංකු සුරැකුම්පත් නිර්ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රමයට බෙදාහැරීම හා ගෙවීම (Delivery Vs. Payment - DVP) සාර්ථකව සිදු කරයි. ඒ අනුව ගනුදෙනු පියවනු ලබන්නේ සුරැකුම්පත් විකිණීම සිදු කරන්නන්ට තම ගිණුමේ ප්‍රමාණවත් සුරැකුම්පත් ප්‍රමාණයක් හා මිල දී ගන්නනට ප්‍රමාණවත් අරමුදල් පවතී ද යන පදනම මත යි. මෙලෙස මිල දී ගැනීමේ දී තත්කාලීන දළ පියවුම් ක්‍රමය මඟින් (Real Time Gross Settlement System - RTGS) ගෙවීම් පියවයි. මෙම පද්ධතිය හරහා පියවීම් කරනු ලබන ගනුදෙනු නැවත අවලංගු කළ නොහැකි ය.

රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන්, නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු පද්ධතිය (SSDS) වගකීම දරයි. රජයේ සුරැකුම්පත්වල භාරකාරත්වය මෙම පද්ධතියේ වාර්තා වේ. නිර්ලේඛන සුරැකුම්පත් හිමියන්ට මෙම ක්‍රමය යටතේ ඔවුන්ගේ ආයෝජනවල පූර්ණ තොරතුරු "ලංකා සෙකියු" ජාලයට ඕනෑම වේලාවක සම්බන්ධ වී ලබා ගත හැකි ය.

නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයක් බිහි කිරීමට රජයේ අවධානය යොමු වූයේ පහත හේතු මත පදනම් වෙමිනි. ඒ අනුව ශ්‍රී ලංකා සුරකුම්පත් වෙළෙඳපොළ සඳහා නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයක අවශ්‍යතාව පහත සඳහන් කරුණු මත සනාථ කළ හැකි ය. එම කරුණු මෙම නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයේ ප්‍රතිලාභ ලෙස ද විග්‍රහ වේ.

- නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ ක්‍රමය මගින් ලේඛන සහිතව සුරකුම්පත් හුවමාරු කිරීමේ අවශ්‍යතාව මඟ හැරෙනු ඇත. මීට වසර කිහිපයකට ඉහත දී රජයේ සුරකුම්පත්වල සියලු ම ආයෝජකයන් සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ලේඛනමය සහතික පත්‍ර මුද්‍රණය කර නිකුත් කිරීමට සිදු වී ඇත. සතියක් සඳහා සාමාන්‍යයෙන් 3000 ත් 4000 ත් අතර භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් සහ 1000 ත් 2000 ත් අතර භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ පොලී ගෙවීම සඳහා සතියකට පොලී කුපන්පත් 5000 ක් පමණ අවේක්ෂණය කිරීම සඳහා කාලය විශාල වශයෙන් මිඩංගු කළ යුතු වේ. ලේඛන භෞතික වශයෙන් හුවමාරු කිරීමේ අවශ්‍යතාවය අදාළ නිර්ලේඛන සුරකුම්පත් හඳුන්වා දීමත් සමඟ අවශ්‍ය නොවී ය.
- සුරකුම්පත් ගනුදෙනු සඳහා භෞතික ආවේක්ෂණයක් නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයක් නිසා අවශ්‍ය නොවනු ඇත. එබැවින් නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ ක්‍රමයකින් වෙළෙඳ කටයුතු පහසු වනු ඇත.
- සුරකුම්පත්‍ර සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමයක් පවත්වා ගැනීම නිසා ඇතිවන වාසියක් වන්නේ වෙළෙඳ කටයුතු දියුණු කිරීමට පදනම් වන ආකාරයෙන් නවීන තාක්ෂණය යොදා ගැනීමට හැකි වීමයි. පෙර පැවති ලේඛන සහිත ගනුදෙනු නිසා නවීන තාක්ෂණය යොදා ගැනීමේ දී යම් යම් සීමා පැන නඟී. නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමය සහ මධ්‍යම තැන්පතු ක්‍රමය විද්‍යාත්මක පදනමක් යටතේ ක්‍රියාත්මක වීම නිසා සුරකුම්පත් පියවීම නව තාක්ෂණය මත සිදුකළ හැකි ය.
- නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමයක් සහ සුරකුම්පත් සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමයක් වෙළෙඳපොළ සංවර්ධනය සඳහා දායක වනු ඇත. අදාළ ක්‍රම යටතේ සුරකුම්පත් වෙළෙඳාම සහ ගනුදෙනු කිරීම අප්‍රමාදව සිදු වන බැවින් රජයේ සුරකුම්පත් වඩාත් ජනප්‍රිය ආයෝජන මාර්ගයක් වශයෙන් දියුණු විය හැකි අතර, ඒවාට අදාළ ද්විතියික වෙළෙඳපොළේ ගනුදෙනු ද ප්‍රසාරණය වනු ඇත. රජයේ සුරකුම්පත් සඳහා වැඩි විය හැකි ඉල්ලුම නිසා රජයට අවශ්‍ය ණය ඉතා අඩු පිරිවැයක් යටතේ ලබා ගැනීමට හැකි වනු ඇත.
- නව ක්‍රම නිසා නවීන තාක්ෂණය යොදා ගැනීමට හැකි වන බැවින් සුරකුම්පත් වෙළෙඳාමට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ පුරුදු ශ්‍රී ලංකාවේ සුරකුම්පත් වෙළෙඳපොළ තුළ ද ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.
- නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ ක්‍රමය යටතේ සුරකුම්පත්වලට අදාළ ගෙවීම් තත්කාලීන දළ පියැවුම් ක්‍රමය යටතේ ගෙවීම් මත අයිතිය පවරා දීම (DvP) පදනම් කොටගෙන සිදු වන බැවින් සුරකුම්පත්වලට සම්බන්ධ අරමුදල් පියවීමේ දී අවදානම අඩු වනු ඇත. නිර්ලේඛන සුරකුම්පත් ක්‍රමය තත්කාලීන දළ පියවුම් ක්‍රමයට සම්බන්ධ බැවින් සුරකුම් ගනුදෙනු සඳහා ගෙවීම් ඉතා ඉක්මනින් අවම ආදායමක් යටතේ සිදු කිරීමට හැකි වනු ඇත. නව ක්‍රමය යටතේ සුරකුම්පත්

ගනුදෙනු සඳහා අවශ්‍ය වන අරමුදල් ගිණුම්වල නොමැතිනම් සුරැකුම්පත් ගනුදෙනු කිරීම නවතින අතර, මේ නිසා අවදානම අඩු වනු ඇත.

- සුරැකුම්පත්වල සමස්ත ජීවිත කාලයට අදාළ තොරතුරු විද්‍යාත්මක මාර්ගයෙන් නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය යටතේ තබා ගත හැකි ය. මේ නිසා සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ වාර්තා නැති වීමේ අවදානම අඩුවන අතරම තොරතුරු පහසුවෙන් ලබාගැනීමට හැකි වන ක්‍රමයක් බිහිවනු ඇත.
- නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය තත්කාලීන දළ පියවුම් ක්‍රමයට සම්බන්ධව ක්‍රියාත්මක වන බැවින් සුරැකුම්පත් වෙළෙඳාමට අදාළ ගනුදෙනු පහසු කිරීම සඳහා අන්තර් දින ද්‍රවශීල සැපයුම් ක්‍රමයක් (Intra-day Liquidity Facility - ILF) ක්‍රියාත්මක වේ. මේ නිසා පද්ධතියේ පාර්ශවකරුවන්ට තම ගිණුම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය අරමුදල් කිසිම ගෙවීමකින් තොරව දවස ඇතුළත භාවිතා කළ හැකි වනු ඇත. (www.cbsl.gov.lk, 2014).

නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමය බිහි වීමේ නීතිමය පදනම පිළිබඳ සැළකීමේ දී 1995 අංක 31 දරණ භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත හා 1995 අංක 32 දරණ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිර්ලේඛනව නිකුත් කිරීමට අවශ්‍ය නීතිමය පදනම සකස් කළේ ය. 2002 අංක 32 දරණ මූල්‍ය නීති පනතට අනුව මධ්‍යම තැන්පතු ක්‍රමය හා පියවීමේ ක්‍රමය ඉලෙක්ට්‍රොනික ආකාරයට සිදු කිරීමට නීතිමය අවශ්‍යතාව සම්පූර්ණ කළේ ය. එමෙන් ම 2004 අංක 1 සහ 2004 අංක 2 දරණ භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත් තුළින් එතෙක් නිකුත් කර තිබූ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ද නිර්ලේඛන ආකාරයෙන් නිකුත් කිරීමට අවශ්‍ය නීතිමය අවසරය ලබා දුන්නේ ය.

මූල්‍ය යටිතල පහසුකම් වර්ධනය කරමින් නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයට 2004 වර්ෂයේ දී ශ්‍රී ලංකාව කොතරම් දුරට අනුගත වූවා දැයි දැක්වීමේ දී, ලංකා සෙට්ල් පද්ධතියේ ප්‍රධාන කොටස් දෙක වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය හා “ලංකා සෙකියු” පද්ධතිය ඉහළ යමින් පවතින ගනුදෙනු ප්‍රමාණයන්ට පහසුකම් සැලසීම බාධාවකින් තොර ව සිදු කරන ලදී. 2004 වර්ෂයේ දී දළ පියවීම් පද්ධතිය මඟින් රු. බිලියන 59,551 ක සමස්ත වටිනාකමින් යුතු ගනුදෙනු 317,940 පියවන ලදී. එය 2013 වර්ෂයට සාපේක්ෂව 10.1% ක වර්ධනය වීමකි. 2014 වර්ෂයේ අවසානයේ දී ලංකා සෙකියු පද්ධතියේ පැවති නිර්ලේඛන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රු. බිලියන 4092 කි. එහි වටිනාකම රු. බිලියන 750.3 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වලින් ද, වටිනාකම රු. බිලියන 3341.7 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් ද සමන්විත විය (මහ බැංකුව, 2014).

**සමාලෝචනය**

අයවැය හිඟය පියවීම හා අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රජය සුරැකුම්පත් නිකුත් කරයි. එම සුරැකුම්පත් භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් මත රඳා පවතී. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතීයික වෙළෙඳපොළ ලෙස කොටස් දෙකකින් සමන්විත වේ. රජය මෙම සුරැකුම්පත් නිකුත් කරනුයේ වෙන්දේසි ක්‍රමයක් මත පදනම් වෙමින් ප්‍රාථමික වෙළෙඳපොළට ය. එමෙන් ම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මෙම රාජ්‍ය සුරැකුම්පත් විශාල ආයතනික

ආයෝජකයින්ට විකුණනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් කෙටිකාලීන වන අතර, භාණ්ඩාගාර බැඳුම්කර දිගුකාලීන මූල්‍ය උපකරණ වේ. පෞද්ගලික සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ මැදිකාලීනව ණය වෙළෙඳපොළෙන් අරමුදල් ලබා ගැනීම පිණිස සුරැකුම්පත් නිකුත් කරයි. කෙසේ වුව ත් නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක් බිහිවන්නේ, රජයේ සුරැකුම්පත් වෙළෙඳාම සංවර්ධනය කිරීමේ අභිලාශය ඇතිව ය. ඒ අනුව ආයෝජකයින්ට වඩාත් ප්‍රතිලාභ සැලසෙන පරිදි මධ්‍යගත පරිගණක පද්ධතියක් හරහා මෙම නිර්ලේඛන සුරැකුම්පත් නිකුත් කිරීම සිදු වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ

විදානපතිරණ, යූ. (1987), *''සුරැකුම්පත්, කොටස්, විනිමය බ්‍රෝකර්වරුන් හා විකුණුම්කරුවන්''*, ආර්ථික විමසුම - නොවැම්බර්.

සමරසිරි, පී. (2011), *''මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය''*, තෙවන සංස්කරණය, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.

හේමචන්ද්‍ර, ඩබ්.එම්. (2004) , *''ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සුරැකුම් සඳහා නිර්ලේඛන සුරැකුම්පත් ක්‍රමයක් සහ මධ්‍යම තැන්පතු ක්‍රමයක්''*, සටහන - පෙබරවාරි/මාර්තු, ශ්‍රී ලංකා මහ බැංකුව.

Central Bank of Sri Lanka, http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/efr/annual_report/AR2014/Sinhala/12_Chapter_08.pdf, viewed on 23 October 2015.

OECD, *"Fiíncial Market*", http://www.oecd.org/finance/financial-markets /46795798.pdf, viewed on 126 October 2015.